# දෙල්ගමුව රජමහා විහාරය සහ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ

ශ්‍රී ලංකාවේ විහාරස්ථාන අතුරින් ඉතාමත්ම වැදගත් ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන දෙල්ගමුව රාජමහා විහාරය පිහිටා ඇත්තේ සීතාවකපුර-රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රදේශයේයි. කුරුවිට (කුරු+ඕවිට=කුරුවිට) යන නාමය පටබැඳී ඇත්තේ අතීතයේ මෙම ප්‍රදේශයේ වෙල් යායක නොහොත් ඕවිටක කුරු වර්ගයේ ඇතුන් ගැවසුණු නිසා බව කියවේ. සුප්‍රසිද්ධ බෝපත් ඇල්ල පිහිටා ඇත්තේ මෙම විහාරස්ථානයට කි.මී. 5 ක් පමණ දුරිනි. නමුත් දෙල්ගමුව විහාරස්ථානයට එතරම් පිරිසක් නොයන්නේ එය එතරම් ජනතාව අතර ප්‍රසිද්ධ නොමැති නිසා විය යුතුය. කුරු ගඟ හා සශ්‍රික වෙල්යායක් අතර මදක් උස් වූ බිමක පිහිටා මෙම විහාරය ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුව ක්‍රි.ව. 1549 සිට 1592 දක්වා වර්ෂ 43 ක කාලයක් පුරා කුරහන් ගල් කරඬුවක් තුල බහා ආරක්ෂා කරගත් විහාරස්ථානය ලෙස ඉතිහාසගත වී ඇත.




කුරුවිට දෙල්ගමුව රජමහා විහාරය සහ එහි කුරහන් ගල් කරඬුව

www.Lakviskam.org

කෝට්ටේ යුගයේදී ප්‍රධාන භූමිකාවක් සිදු කල මෙම විහාරස්ථානයේ ඉතිහාසය ඉන් ඔබ්බටද දිවයයි. එහෙත් ඒ පිළිබඳ ලිඛිත සාක්ෂි ඇත්තේ ඉතා අල්ප වශයෙනි. මෙහි ඉතිහාසය ගැන කරුණු ගවේෂණය කරන්නෙකුට තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රධානම මාර්ගයක් වන ජනප්‍රවාද, වර්තමානයේදී ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මීට අමතරව රත්නපුර සමන් දේවාලයේ පුරාණ තුඩපත් හා ලේකම් මිටි, අතීතයේ ලියවුනු කාව්‍ය සහ ඓතිහාසික ග්‍රන්ථ කිහිපයක් අදටත් ඉතිරිව ඇත. දෙල්ගමුව විහාරය හා බැඳුණු තවත් තොරතුරු ප්‍රදේශයේ පැරණි පවුල් හා විහාරස්ථාන ආදියේ  අප්‍රකටව ඇති ලේඛන වල සඳහන් බවට ප්‍රදේශයේ තතු දන්නෝ පවසති.

**දෙල්ගමුව රජමහා විහාර සංචාරය පිළිබඳව**

**අප සංචාරයේ අරමුණ:** විහාරස්ථානය වැඳපුදා ගැනීම, කුරහන් ගල් කරඬුව දැක බලා ගැනීම සහ ඉතිහාස කරුණු අධ්‍යයනය කිරීම
**දිනය:** 2013 අගෝස්තු 24
**ගමන් කල ආකාරය:** පුද්ගලික මෝටර් රථවලින්
**සහභාගී වූවන් ගණන:** 07
**විශේෂ සටහන්:** මෙය බෞද්ධ සිද්ධස්ථානයක් බැවින් සංවර සුදු ඇඳුමින් සැරසී මත්පැන් පානයෙන් වැලකී එහි යන්න. සංවරව හැසිරෙන්න. පුරාවස්තු ආදිය ආරක්ෂා කරන්න. පරිසරයේ, විහාරයේ පිරිසිදු කම ආරක්ෂා කරන්න. විහාරයෙන් පිට වාහන නවතා තැබිය හැක. ගමන් කර යුතු මාර්ග පටු වුවත් හොඳ මට්ටමේ ඇත. විහාරස්ථානයේ දියුණුවට හැකිනම් ආධාර කරන්න,
**විශේෂ ස්තූතිය** කුරුවිට ප්‍රදේශවාසීන්
**මෙම වාර්තාව සැකසූයේ:** නිශාන් කුළසිංහ විසිනි

**කොළඹ සිට දෙල්ගමුව විහාරයට ලඟාවිය හැකි මාර්ග**

කොළඹ > අවිස්සාවේල්ල > ඇහැළියගොඩ > කුරුවිට > කුරුවිට තැපැල් කාර්යාලය ඉදිරිපිට-කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය අසල (වම් අත පැත්ත) > සද්ධාතිස්ස මාවත (දකුණු අත පැත්ත) > දෙල්ගමුව රජමහා විහාරය (75km)

කොළඹ > පාදුක්ක > ඉංගිරිය > ඉද්දගොඩ > හොරණ මාර්ගය ඔස්සේ > ගෝනපිටිය පාර > කුරුවිට > කුරුවිට තැපැල් කාර්යාලය ඉදිරිපිට-කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය අසල (දකුණු අත පැත්ත) > සද්ධාතිස්ස මාවත (වම් අත පැත්ත) > දෙල්ගමුව රජමහා විහාරය (80km).



කොළඹ අවිස්සාවේල්ල කුරුවිට මාර්ගය

www.LakViskam.org

**දළදා වහන්සේ සහ ඉතිහාසය සැකෙවින්**

ක්‍රි.ව. 371 දී මහසෙන් රජුගේ පුත්වන කිර්ති ශ්‍රී මේඝවර්ණ රාජ සමයේදී දන්ත කුමරු හා හේමමාලා කුමරිය කළිඟු රටේ සිට ගෞතම බුදු රදුන්ගේ වම් දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරවීමෙන් පසුව උන්වහන්සේ මෙරටේ අග්‍රස්ථානයේලා සැලකිණි. එනම් රාජ්‍ය බලය හිමි තැනැත්තාගේ ප්‍රමුඛතම වගකීමක් වූයේ දළදා වහන්සේ ආරක්ෂා කරගැනීමයි. දන්ත ධාතූන් වහන්සේ අහිමි වුවහොත් රාජ්‍ය බලයද අහිමිවුවා සේ ජනතාව සහ පාලකයින් සැලකූහ. එසේම රාජ්‍ය බලය අල්ලාගැනීමට මෙම දළදා වහන්සේ අත්පත් කර ගැනීම අත්‍යාවශ්‍ය කාරණයක් විය. මෙවැනි හේතු නිසා උන්වහන්සේ රැක ගැනීමට එය භාර සෑම රජ කෙනෙකුම, නිලධාරියකුම හා සංඝයා වහන්සේ දිවි හිමියෙන් කටයුතු කළහ.

ක්‍රි.ව. 1372-1408 කාලයේදී 5 වන බුවනෙකබාහු රජතුමා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිය රාජධානිය කර ගත්තේය. ඔහුගෙන් පසු රජ වූ වීරබාහු රජතුමා කෝට්ටේ දළදා මන්දිරයක් ඉදිකොට ගම්පොල සිට දළදා වහන්සේ කෝට්ටේට වැඩම කරවයි. මේ සම්බන්ධ තොරතුරු ඓතිහාසික අස්ගිරි තල්පතේ දක්වා ඇත. 6 වන පරාක්‍රමබාහු රජු සමයේ (1505 නොවැම්බර් 15) පෘතුගීසින් ශ්‍රී ලංකාවට ගොඩ බසින ලදී. ක්‍රි.ව. 1521 දී 6 වන විජයබා රජුගේ පුතුන් වන රයිගම්බණ්ඩාර කුමරු පස් වළල්ලවිට කෝරලයේත්, මායාදුන්නේ කුමරු සීතාවකත්, 7 බුවනෙකබාහු කෝට්ටේත් රජකමට පත් විය. 7 වන බුවනෙකබාහු රජුට දාව උපන් පුතෙකු නොමැති වූ කල ඔහුගේ මුණුපුරු වීදිය බණ්ඩාරගේ පුත් ධර්මපාල, පෘතුගීසී මෙහෙයවීමෙන් ක්‍රි.ව. 1557 දී රජ වෙයි. ධර්මපාල කතෝලික ආගම වැළඳගෙන දොන් ජුවන් නමින් බෞතීස්ම විය. මොහු ඉතා අසාර්ථක පාලකයකු වූ අතර මේ සමයේදී පන්සල් විනාශ කරමින් භික්ෂූන් වහන්සේ ඝාතනය කරමින් මහත් වූ විනාශයක් බුද්ධාගමට සිදු කරන ලදී.

**දළදා වහන්සේ දෙල්ගමුවට වැඩමවීම සහ එයට පසුබිම සකස් වීම**

කෝට්ටේ යුගය අවසන් කාලයේදී ආගම-දහම පිරිහෙන්නට පටන් ගනී. පෘතුගීසින් විහාරස්ථාන කොල්ලකමින් ඒවා විනාශ කරමින් තම රෝමානු කතෝලික ආගම එම ප්‍රදේශ වල පතුරන්නට පටන් ගත්හ. මේ අතර ඔවුන් දළදා

වහන්සේ පැහැර ගැනීමටද ප්‍රයත්න දැරූහ. කෝට්ටේ දළදා මැදුර කඩාබිඳ දමා ඒ මත කතෝලික පල්ලියක් ගොඩ නැගූහ. එකල දළදාව භාරව කටයුතු කළේ දන්ත කුමරුගේ පරම්පරාවෙන් පැවත ආ කීරවැල්ලේ ග්‍රාමයේ හිරිපිටිය දිවනරාළ යි. හෙතෙම නින්දේදී දුටු සිහිනයක් අනුව දන්ත ධාතුව රැගෙන සීතාවකට රාජායට පලාගියේය. දිවනරාළ දුටු සිහිනය නම් මහලු පුද්ගලයකු විසින් ඔහුව ආමන්ත්‍රණය කර "කොට්ටෙ කළාලේ කිසිල්ලේ දත මැද ගෙන යන්න රාළේ" යනුවෙන් පැවසීමයි (මෙය ජනකවි දෙපදයක් ලෙසත් සැලකේ). මෙහි ගැඹුරු අරුත නම් 'කෝට්ටේට කලාවූ ඇල්මෙන් ඵලක් නොමැත. දන්ත ධාතුන් වහන්සේ මැද රටට වඩම්වන්න'. වහා ක්‍රියාත්මකවූ දිවනරාළ දළදා වහන්සේ කරඬුවෙන් පිටතට ගෙන සිය කිණිසි කොපුවේ සඟවා, කරඬුව තුල කලින් ඇත්දළින් සකස් කළ දළදා අනුරුවක් තැම්පත් කර රාත්‍රියේදීම දියවන්නා ඔය තරණය කර පලා යයි. පසුව ඔහු සීතාවක මායාදුන්නේ රජු හමුවී දළදාව රජුට භාර කරයි. තවත් දළදා අනුරුවක් පසුව වීදිය බණ්ඩාර අතටද පත් කරන ලදී.

හිරිපිටිය දිවනරාළ දියවන්නාව හරහා දෙල්ගමුව විහාරයට දළදාව රැගෙන ගිය බවට ඇති ප්‍රධාන කතා පුවතට අමතරව දන්තධාතුව රැගෙන ගිය වෙනත් ගමන් මාර්ගයක් පිලිබඳව අප්‍රකට කතා පුවතක්ද ඇත. එය පහත පරිදි වේ.

හිරිපිටිය දිවනරාළ දළදා වහන්සේ රැගෙන රහසින් කෝට්ටේ රාජධානියෙන් පිටත් වුවත් අපේක්ෂිත ගමන් මාර්ගයෙන් සීතාවකට රාජාට ළගාවීමට බාධා පැමිණි නිසා ගමන් මාර්ගය වෙනස් කර මාතර දෙසට ගමන් කර තවලම, හබරකඩ හරහා දෙනියායට ළගා වී කොලවෙනිගමේ උග්ගල්පත ගල් ලෙනෙහි දන්ත ධාතුව සැඟවීය. හිරිපිටිය දිවනරාළ අංගම් සටන් ශිල්පියකු වූ බුත්කන්ද අතුකෝරලගේ හීන්හාමි අත පණිවුඩයක් යවා දක්ෂ අංගම් සටන් ශිල්පියකු වූ කොලොන්න මඩුවන්වෙල විජේසුන්දර ගම්භාර තැන ගෙන්වාගෙන දළදා වහන්සේ ආරක්ෂිතව ඉදිරියට රැගෙන යායුතු අන්දම රහසිගතව සාකච්ඡා කළහ. පාත්‍රයක බෝ පැලයක් රෝපණය කර එයින් හාස්කම් සිදු වෙයයි ප්‍රසිද්ධ කොට එය සමග හිරිපිටිය දිවනරාළ වෙස්වලාගෙන දළදාව රැගෙන ගොස් රක්වානේ කෝපිකැල්ල නම් ගමේ ගල්ලෙනක සඟවන ලදී. ඉන්පසු කැකිල්ලපිටිය ගම හරහා පොතුපිටියට ගොස් පානවල කන්දේ කොස් බෙනයක සඟවා එළඹෙන දිනයේදී රඹුක රජගෙදරට වැඩමවන ලදී (මහා පරාක්‍රමබාහු කුමරු සිය පියා වන මානාභරණ රජුගේ භාරයක් ඔප්පු කිරීම සඳහා මෙම රඹුක රජගෙදර නවාතැන්ගෙන ඇත. එමෙන්ම ආර්ය කාමදේව ඇමතියා මැණික් ගැරීමට ගිය අවස්ථාවේදී මෙම ගෙදර නතර වී සිට ඇත. මේ නිසා මෙම ගෙදර රජගෙදර ලෙස ප්‍රසිද්ධ වී ඇත). පසුදින දන්ත ධාතුන් වහන්සේ අරුක්ගොඩ පත්තිනි දේවාල ගල් ලෙනට වැඩම කරවීය. දින තුනක් එහි වැඩ විසූ දළදා වහන්සේට වතාවත් බුද්ධ පූජා සිදු කෙරුණු අතර ඒ සඳහා අවැසි සහල් දියැද්දේ ගෙදර නම් ගම ගෙදරකින් සපයා දී ඇත. අරුක්ගොඩ දේවාලයේ කපු මහතා වූ ශීලවංශ කපුරාළ විසින් එම දේවාලයේ නැටුම් කණ්ඩායමද, මඩුවන්වෙල අංගම් සටන්කරුවන්ද, අරුක්ගොඩ අංගම් සටන් රංගන ශිල්පීන් සමග තනබෙල ඔස්සේ කලවානට ගොස් එහිදී තවත් සටන් පුහුණු නර්තන කණ්ඩායමක් සමග බෝ පැලය රෝපණයට යනබව හඟවමින් දෙල්ගමුව විහාරය බලා පිටත් වූහ. ස්තෝත්‍ර ගී ගයමින් කොලදිවියන්කඩ හරහා හංගමුවට පැමිණ එහිදී හංගමුව හා බටුගෙදර අංගම් සටන් කරුවන්ගේ ආරක්ෂාව සහිතව දෙල්ගමුව විහාරයට දළදා වහන්සේ වැඩම කලේය.

හිරිපිටියේ දිවනරාළගේ මෙම උපක්‍රමශීලී ක්‍රියාමාර්ග හා ස්ථානෝචිත ප්‍රඥාව නිසාම අදටත් අප සියළු දෙනාටම වැඳපුදා ගැනීමට උතුම් දළදාවහන්සේ මහත් තේජසින් වැඩහිඳී. අප සියළු දෙනාම ශ්‍රී ලාංකිකයින් වශයෙන් ඔහුට ණයගැති වන්නෙමු.

මෙසේ සැබෑ දළදා වහන්සේට සිදු වූ දේ නොදත් පෘතුගීසීන් උන්වහන්සේ විනාශකල බවට සටහන් තබා ඇත. පෘතුගීසි ඉතිහාසකරුවෙක් වන ෆර්නම් ඩි ක්වයිරෝස් ඔහුගේ The temporal and spiritual conquest of Ceylon කෘතියෙන් හා තවත් ඉතිහාසකරුවකු වූ ගර්සන් ද කුඤ්ඤා රාජකීය ආසියාතික සගරාව-බොම්බාය ශාඛාවේ 1875 කලාපයේ දී දක්වා ඇත්තේ දළදාව විනාශ කල බවත්ය. ඒස්.ජී. පෙරේරා නම් වූ පියතුමක් ක්‍රි.ව. 1927 Ceylon Daily News පුවත්පතේ ලිපියකකින් දොන් ජුවන් ධර්මපාල රජු ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමෙන් පසුව වීදිය බණ්ඩාර දළදාව රැගෙන යාපනයට පලාගිය බවකි (මෙය දළදා අනුරුවකි). එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් ඉතිහාසඥයාද Short history of Ceylon කෘතියේ දක්වා ඇත්තේ ක්‍රි.ව. 1552 දී පෘතුගීසීන් විසින් වීදිය බණ්ඩාර අල්ලාගෙන ඔහු සතුව තිබූ දළදාව විනාශ කල බවත්ය. එසේම ජී. ඊ. හාර්වේ නැමැත්තා History of Burma ඉතිහාස කෘතියේ සඳහන් කරන්නේ ක්‍රි.ව.1560 දී දළදාව පෘතුගීසීන් විසින් අත්පත් කරගෙන ගෝවේදී ආර්ච් බිෂොප්ගේ නියමය අනුව කුඩු

www.lakviskam.org

කර ගින්නෙන් අළු කරවා එම අළු ගඟේ පා කර හැරිය බවකි. කෙසේ වෙතත් පෘතුගීසීන් හා වෙනත් උගතුන් මෙසේ අදහස් දක්වා තිබුනද ඒවා සත්‍යයෙන් තොර බව ඉතා පැහැදිලිය.

**දළදා වහන්සේ සහ දෙල්ගමුව විහාරය**

මායාදුන්නේ රජු සිය රාජ්‍යත්වය සම්පූර්ණ කරවන දළදා වහන්සේ ලැබීමෙන් අපමණ සතුටට පත් විය. එහෙත් එකල සීතාවක රාජධානියටද පෘතුගීසි හා ස්වදේශික බලපෑම් එල්ලවීම නිසා දළදා වහන්සේ තවදුරටත් රට තුලට ගෙන ගිය මායාදුන්නේ රජු ක්‍රි.ව. 1549 දී සබරගමුවේ දෙල්ගමුව විහාරයේ වැඩ සිටි ඔහුගේ හිතවත් පඬි රුවනක් වූ ෂඩ් භාෂා පරමේශ්වර මහින්දාලංකාර භික්ෂූන් වහන්සේ වෙත භාර කරයි. එකල රාජ අනුග්‍රහය ලැබූ අංග සම්පූර්ණ විහාරස්ථානයක් වූ බැවින් දළදා වහන්සේට වැඩ සිටීමට සුදුසු පරිසරයක් එහි විය. පරසතුරු ආක්‍රමණ පහව යනතෙක් දළදා වහන්සේට සුරක්ෂිතව වැඩ සිටීමට දෙමහල් දළදා මැදුරක්ද කරවා එහි වගකීම් ඉටු කිරීමට නිලතල දරන්නන් පත්කොට ගම්බිම් ආදියද විහාරයට පූජාකරන ලදී. මායාදුන්නේ රජුගෙන් පසු රජ වූ ශිව ආගමට වඩාත් ලැදි සීතාවක රාජසිංහ රජුද (ක්‍රි. ව. 1578 – 1592) විහාරයට ගම්බිම් පූජා කර ඇත. එසේම එම රජු සමයේ දළදා පෙරහැර වසර 11 ක් පුරාවට දළදාව දෙල්ගමුව විහාරයේ සිට රත්නපුර සමන් දේවාලයට වඩම්වවා මහ පෙරහැර සිදු කර ඇත. එම දළදා පෙරහැර සිහි කර අද දක්වාම රත්නපුර සමන් දේවාලයේ ප්‍රථමයෙන් ධාතු පෙරහරක් සිදු කරයි.


www.Lakviskam.org

විහාරස්ථානයේ වර්තමාන අංග

දළදා වහන්සේ දෙල්ගමුව විහාරයේ වැඩ සිටිනා ආරංචිය ක්‍රමයෙන් ප්‍රචලිත වුයෙන් නැවත උන්වහන්සේට තර්ජනාත්මක තත්වයක් මතුවිය. පෘතුගීසීන් පමණක් නොව අනෙකුත් ප්‍රාදේශීය රාජ්‍යයන්ගේ ප්‍රභූන් විසින් දළදාවහන්සේ පැහැර ගැනීමට උත්සහාකරන්නට වුහ. මෙවන් සැක සහිත අවස්ථාවලදී මහින්දාලංකාර හිමියන් දළදා වහන්සේ ඉනෙහි සඟවාගෙන අවට ගම්මානවල හා පලාබත්ගල යන ස්ථාන වල සැඟවෙමින් දළදා වහන්සේ ආරක්ෂා කර ගත්හ. පසුව උපක්‍රමයක් මගින් දළදා වහන්සේ සඟවා තැබීමට තීරණය කල උන්වහන්සේ කුරු ගඟෙන් ලැබුණු නිල මැණිකකින් ආවරණයක් කරවා දළදාව එයතුල බහාලූහ. ඉන්පසු විහාර මැදුරේ පහත මාලයේ අටරියන් බුද්ධ ප්‍රතිමාවට පිටුපසින් විශාල ප්‍රමාණයේ කුරහන් ගලක් තුල සඟවා තැබූහ. මෙකල බොහෝදෙනා කුරහන් ගල් භාවිතා කල අතර මෙවන් විශාල කුරහන් ගල් විහාර කර්මාන්තයේදී ගල්, මැටි ආදිය සියුම්ව ඇඹරීම ආදී කටයුතු වලටද භාවිත කෙරුණි. මේ නිසාම මෙම කුරහන් ගල කිසිවෙක් සැක නොකළේය. දළදා මැදුරේදී පිළිම වහන්සේ ඉදිරිපිට පුද පූජා පවත්වන විට එය පෙරසේම දළදා වහන්සේට කරන පූජාවක්ම විය. මෙම රහස දැන සිටියේ මහින්දාලංකාර හිමියන් හා හිරිපිටියේ දිවෙනරාළ පමණක් බව කියවේ. මෙලෙස ක්‍රි.ව. 1549 සිට 1592 දක්වා වසර 43 ක් දළදා වහන්සේ ආරක්ෂා වුයේ මෙම කුරහන් ගල් කරඬුව තුලය. කොනප්පු බණ්ඩාර නොහොත් පළමුවන විමලධර්මසූරිය රජතුමා ක්‍රි.ව. 1592 දී දෙවනගල රතනාලංකාර හිමියන්ගේ අනුශාසනා පරිදි දළදාවහන්සේ මහනුවරට වඩම්මවා ගත්තේය. මහනුවර දළදා මාළිගයක් ඉදි කරන තෙක් තාවකාලිකව මහනුවර අස්ගිරියේ ගෙඩිගේ විහාරයේ හෙවත් ආදාහනමළු විහාරයේ තැම්පත් කරන ලදී. විමලධර්මසූරිය රජතුමා යටතේද

දළදා වහන්සේගේ දියවඩන නිලමේ තනතුර හිරිපිටිය නිලමේතුමා දැරූ අතර ඔහු අඩුම තරමේ වසර 50 ක්වත් දියවඩන නිලමේ තනතුරේ කටයුතු රජවරුන් කිහිපදෙනෙකු යටතේ සිදු කර ඇත.




කුරහන්ගල් කරඬුව

පසුව පෘතුගීසීන් සබරගමුව ආක්‍රමණය කර විහාරස්ථානය කඩා බිඳ දමා වස්තුව කොල්ලකා ඔවුන්ගේ සෙබළුන් යොදවා කුරුවිට බලකොටුව ලෙස වර්ෂ කතිපයක් තබා ගත්තත් අවසානයේදී ඔවුන් පරාජය වී විහාරය සියවස් ගණනාවක් නටබුන්ව වනාන්තරයෙන් වැසී පැවතිනි. මෙම විහාරය නැවත ගොඩ නැගීම සිදුවන්නේ 19 වන සියවසේ මුල් භාගයේ කොළඹ සද්ධාතිස්ස නම් භික්ෂූන්වහන්සේගේ මූලිකත්වයෙනි. අතීතයේ තිබූ දේ අතුරින් අද ජීවමාන වන්නේ කුරහන් ගල, වසර 800 ක් පමණ පැරණි බෝධීන් වහන්සේ, ශෛලමය මල් ආසනය, වාහල්කඩ, නා ගස, පැරණි දළදා මැදුරේ අත්තිවාරම හා පියගැට පෙළ ආදී දේ කිහිපයක් පමණි. දෙල්ගමු විහාරයට පවරා දී තිබූ විශාල ඉඩම් වලින් කොටසක් ඉංග්‍රීසින්ගේ මුඩු බිම් පනත මගින් රජයට පවරා ගත් අතර ඉතිරිය අවට ගම්වාසීන් විසින් අයිති කොටගෙන ඇත. රජු විසින් ඉඩම් විහාරයට පිදූ බවට සඳහන් කර තිබී යයි සැලකෙන සෙල්ලිපි කිහිපයක් පුද්ගලයන් කිහිපදෙනෙක් විසින් තමන්ගේ ඉඩම් නැවත විහාරයට දීමට සිදුවේ යැයි බියෙන් විනාශකර විහාරය අවට වූ පාළු ළිඳකට දමා වැසූ බවට ප්‍රදේශයේ ජනප්‍රවාදයක්ද ඇත.

www.Lakviskam.org

සැවුල් සංදේශයේදී "දෙල්ගමුව වෙහෙර" ලෙසත් මහාවංශයේ "ලබුජගාම විහාරය" ලෙසත් රාජාවලිය හා සුළු රාජාවලිය ග්‍රන්ථ වල "සපරගමු විහාරය" ලෙසත් නම් කර ඇති මෙම විහාරය අලගියවන්න මොහොට්ටාල (අලගියවන්න මුකවෙටි තුමා) රචනය කලාවූ සැවුල් සංදේශය සීතාවක සිට රත්නපුර සමන්දේවාලය දක්වා රැගෙන ආ සැවුලා රාත්‍රියක් මෙම විහාරයේ නවාතැන් ගෙන ඇති බවටත් දැක් වේ. එම සැවුල් සංදේශයේ මෙම විහාරය ගැන වර්ණනා ඇත්තේ මෙසේය;

"උදුලිය සඳකිරණ මිහිපිට හුණු ලෙසට - සුදු වැලි අතුල වැලි මළුවෙහි සැදිසුමට
රුදුනත දරණ යුරු පවුරෙනි යුතු සුමට වදුම - මිතුරු දෙල්ගමුව වෙහෙර ලැගුමට"

"මනරම් සුරඹ සමගින් සුර රද සුමන - ගඳ දුම් මල් පහන් පුදකර නීති වදින
නරදම් සැරි සිරිපද ලසිනි වොරැඳින - විහගුම් සමන් ගිර බල පෙර දෙස පෙනෙන"

"ලොව නොමදින් පිරි ගණඳුර දමා දුර - සිය කිරණින් හිරු පැමිණෙන උදාගිර
ලැගි නිවසින් ලැගි තෙරුවන් මෙනෙහි කර - මිතුර වඩින් දළදාගෙට මනෝ හර"

විහාරයට නැගෙනහිර දෙසින් වලාකුළු මීදුම ආදියෙන් තොර අවස්ථාවලදී ශ්‍රී පාද කඳු මුදුන හොඳින් දිස්වේ. ශ්‍රී පාද කඳු මුදුන නැරඹීමට විශේෂ කුටියක් විහාර භූමියේ ඉදි කර ඇති අතර එහි ඇති කුඩා වීදුරු කවුළුවක් තුලින් බැලූ විට කඳු මුදුන දර්ශණය වී ඇත. වර්තමානයේදී මෙම නැරඹුම් කුටියේ කවුළුව ඉදිරියෙන් බුදු පිළිමයක රස් වළල්ලක් නිර්මාණය කර ඇති නිසා එම කාර්යයට යොදා ගන්නා බවක් පෙනෙන්නට නොමැත. අද එය ශ්‍රී පාද පද්මයට පූජා පවත්වන මල් අසුනක් ලෙස පමණක් යොදා ගන්නා බව පෙනේ.



සිරිපා නැමදුම් හා නැරඹුම් කුටිය හා එහි පිටුපස කවුළුව

මෙම විහාරයට ගිනිකොන දිශාවට වන්නට කුරු ගඟ පිහිටා ඇති අතර අතීතයේදී දළදා සම්දුන්ට පූජා කිරීම සඳහා මල් ලබාගැනීමට මායාදුන්න රජු විසින් කරවූ මල් උයනක් මෙම කුරු ගඟ අසබඩ පිහිටා තිබිණි. මෙම ප්‍රදේශය එකල මල්වත්ත ඕවිට ලෙස හඳුන්වා ඇති බවට කියවේ. අදත් මෙම විහාරස්ථානයට නුදුරින් ඇති බඩහැල් ගොඩ නම් ගම මල්වත්ත ඕවිට ලෙස හඳුන්වයි. ජනප්‍රවාද අනුව එකල මෙම රාජකීය මල් වත්තේ මල් ප්‍රමාණය දිනෙන් දින අඩුවන බව දුටු එහි භාරකරු ඊට හේතුව සොයා ගත නොහැකිව රජුට සැල කර සිටින ලදී. රජතුමා වහා සිය සේවකයන් මාර්ගයෙන් සොයා බැලුවත් ඔවුන්ටද මල් අඩු වීමට හේතුව සොයා ගැනීමට නොහැකි විය. අවසානයේදී අඬබෙරයක් මගින් මෙය සොයා දෙන අයෙකුට වටිනා තෑගී පිරිනමන බව සැලකර සිටින ලදී. එයිනුත් සාර්ථක ප්‍රතිඵල අත් වන බවක් පෙනෙන්නට නොතිබිණි. මල් උයන ආසන්නයේ විසූ "කොටා" යන අනවර්ථ නාමයෙන් හඳුන්වන ලද අත් නොමැති පුද්ගලයෙක්ද මේ සඳහා ඉදිරිපත් විය. ඔහු මල්වත්තේ සැඟ වී සිටිනවිට සුරූපී ලඳුන් කිහිප දෙනෙකු පැමිණ මල් නෙලා ඒවා මල්ලක තැම්පත් කලේලු. කොටා ලඳුන් ආපසු පිටත්වූ පසු ඔවුන් පසුපසින් ගියේලු. මල්ලේ වූ සිදුරක් තුලින් මල් මඟ දිගට වැටී තිබුනෙන් ඔහුට පාර සොයා ගැනීමට අපහසු නොවීය. ඔහු අවසානයේ ලඟා වූයේ සමනල කන්ද මුදුනටයි. ලඳුන් ශ්‍රී පතුලට මල් පූජා කර කොටා දෙසට පැමිණියහ. එහිදී කොටා මල් අනවසරයෙන් රැගෙන යාම ගැන විමසා සිටියේය. ඔවුන් පැවසූයේ තමන් දිව්‍යාංගනාවන් බවත් දිනපතා හිමිදිරියේ බුදු රදුන්ගේ ශ්‍රී පතුල නැමදීමට මෙම මල් ගෙන ගිය බවත් මේ පිළිබඳව රජතුමාට සැල කර සිටින ලෙසත්ය. මෙම කතාව ඇසූ රජතුමාටද එම මාර්ගය ඔස්සේ සිරිපා කරුණා කිරීමට සිත් විය. ඔහු ගමන් ගත් එම මාර්ගය පලාබත්ගල හරහා වැටී ඇති රත්නපුරා මාර්ගයයි. මින් පසු මෙය රජමාවත නමින්ද හඳුන්වා ඇත.

www.Lakviskam.org



ශ්‍රීපාදය ඈතින් දිස්වෙන කඳු වළල්ල හා පුරාණ බෝධීන් වහන්සේ

මෑත අතීතයේ විහාරය අවට සිදු කල පතල් කැපීම් වලදී විවිධ ප්‍රමාණ වල රන් කහවනු කිහිපයක් මතු වී ඇති අතර ඒවායේ බහිරව රූපය හා පංචායුධ රූප කොටා තිබී ඇත. වර්තමානයේ නිදන් සොරුන්ගේ පවා තර්ජනයට ලක්වී

ඇති මෙම විහාරය කැනීම් කර ඉතිහාසය තවදුරටත් මතු කර ගැනීමටත්, නඩත්තු කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා නිසි බලධරයන්ගේ  අවධානය අනුග්‍රය ලැබෙන්නේ නම් තවත් දීර්ඝ කාලයක් අභිමානයෙන් වැජඹෙනු ඇත.

මෙම ලිපියේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org.

lakviskam@gmail.com (2013 ඔක්තෝබර් 13)

www.LakViskam.org